**යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය - 2014**

---

යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය හා අංක 2711- එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව,එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන සහ ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ උතුරු පළාත් සභාව මඟින් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත්වන පදිංචිකරුවන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීමයි. ජල සම්පාදන හා සනීපාරක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, යාපනය ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවය වැඩි කිරීම සඳහා යාපනය ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම එමඟින් තවදුරටත් අපේක්ෂා කර තිබුණි. ණය ගිවිසුම අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අදාළ ව්‍යාපෘති සංරචකයේ මුළු පිරිවැය රු.මිලියන 16,460.07 කට සමාන එජඩො මිලියන 147.32 ක් වූ අතර, එයින් රු. මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් හෙවත් සියයට 52 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. තවද, රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් හෙවත් සියයට 33 ක් සැපයීම සඳහා "එජන්ස් ෆ්‍රැන්සීස් ඩි ඩිවෙලොප්මන්ට්" (Agence Francaise de Development ) එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 2,555.27 කට සමාන එජඩො මිලියන 22.87 ක් හෙවත් සියයට 15 ක් ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) විසින් සැපයීමට එකඟ වන ලදි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර 2017 පෙබරවාරි 14 දින වන විට නිම කිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්,

ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි සිට මැයි දක්වා කාලය සඳහා රු.450,000 ක් වූ කාර්යාල කුලී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව විසින් අයකරන ලද රු.මිලියන 20.11 ක්වූ බැඳීම් හා පොලී ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 නොසැසඳූ ශේෂ

--------------------

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් සිදුකරන කාර්යයන් පිළිබඳ කෙරීගෙන යන වැඩ රු.මිලියන 837.43 ක් විය. කෙසේවුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 743.62 ක් ලෙස දක්වා තිබුණි. රු.මිලියන 93.81 ක වෙනස සසඳා නොතිබුණි.

2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

-----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) විගණන කටයුතු සඳහා 2015 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134(3) හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වලට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 76.45 | 8,541.76 | 505.00 | 3.07 | 420.30 | 5.77 | 769.89 |
| එජන්ස් ෆ්‍රැන්කයිස් ඩි ඩිවලොප්මන්ට් (ඒඑෆ්ඩී) | 48.00 | 5,363.04 | 20.00 | 0.11 | 15.32 | 0.77 | 103.34 |
| ශ්‍රී ලංකා රජය | 22.87 | 2,555.27 | 200.00 | 0.78 | 104.82 | 1.64 | 218.55 |
| | **147.32** | **16,460.07** | **725.00** | **3.96** | **530.44** | **8.18** | **1,091.78** |

3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ විෂය පථය පැකේජ 13 කට බෙදා තිබූ අතර මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 91.72 ක් විය. මෙම පැකේජ 13 න් හරස් මාර්ගවල පූර්ව නළ එළීම්වලට අදාළ වැඩ සහ ප්‍රාදේශීය කාර්යාලය සඳහා ගොඩනැඟිල්ල ඉදිකිරීම පමණක් 2014 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය ආරම්භයේ දී අපේක්ෂා කළ පරිදි , යාපනය අර්ධද්වීපය සඳහා ජලය සැපයීමට ප්‍රධාන ප්‍රභවයන් ලෙස ඉරණමඩු ජලාශය භාවිතා කිරීම, ඉරණමඩු ප්‍රදේශයේ ජීවත්වන ප්‍රජාවගේ විරෝධතා හේතුවෙන් අත්හැර දමා තිබුණි. කෙසේ වුවද යාපනය අර්ධද්වීපයට අවශ්‍ය ජල අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා විකල්ප යෝජනාවක් ලෙස මුහුදු ජලයේ ලුණු ඉවත්කිරීම කෙරෙහි ව්‍යාපෘතියේ කටයුතු පරිවර්තනය කිරීමට 2015 ජුලි 15 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ විෂය පථය සම්පූර්ණයෙන්ම වෙනස් වූ අතර, පිරිවැය හා ව්‍යාපෘතියේ කාලය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.